*Summaries in Sinhala*
*Intervention 2011, Volume 9, Number 2, Page 182- 184*

# Summaries in Sinhala

## යුද්ධයේ බලපෑමට ලක්වූ ලයිබීරියාවේ, සියෙරා ලියෝන් සහ උතුරු උගන්ඩාවේ තරුණ මව්වරු නැවත සමාජීය වශයෙන් ඒකාබද්ධ කිරීම සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ඵලදායී ලෙස වර්ධනය කිරීම

ආයුධ සන්නද්ධ කණ්ඩායම් සමග එක්වී සිටි තරුණ මව්වරු සමාජයට නැවත පැමිණි විට ඒ අය සමාජයීය වශයෙන් හුදෙකලාවීමත් අපවාදයට ලක්වීමත්, කොන්වීමත් සිදුවේ. මෙම නිසා ඔවුන් නැවත සමාජය සමග ඒකාබද්ධකිරීම ඔවුන් සහ ඔවුන්ගේ ප්‍රජාවත් අභියෝගයට ලක්වන කරුණකි. ඔවුන්ගේ දරුවන් නොසලකා හැරීම, ප්‍රතික්ෂේප කිරීම, අපයෝජනයට ලක්වීම වැනි ළමා ආරක්ෂණ ගැටලු වලට මුහුණු පෑමට සිදුවේ. මෙම ලේඛනය මගින් එහි කතෘවරුන් ඔවුන් විසින් ක්ෂෙත්‍රයේ අලුතින්ම භාවිතා කරන ලද - ප්‍රජාව පදනම් කරගත් සහභාගිත්ව ක්‍රියාකාරී පර්යේෂණ ක්‍රමයක් (PAR) පිළිබඳව පැහැදිලි කර ඇත. මීට පෙර සන්නද්ධ කණ්ඩායම් සමග සිටි තරුණ මව්වරු සහ ඔවුන්ගේ ප්‍රජාවේ සිටින වෙනත් අවදානම් වලට ලක්වූ තරුණ මව්වරු මෙහිදී ඵලදායී ආකාරයට සහභාගී වූහ. මෙම ව්‍යාපෘතිය ලයිබීරියාව, උතුරු උගන්ඩාව සහ සියෙරා ලියොන් යන රටවල් තුනේ පිහිටි ක්ෂේත්‍ර 20 ක ක්‍රියාත්මක කරන ලදී. මෙය අධ්‍යාපනඥයින් හා රාජ්‍ය නොවන අංශයේ පාර්ශවකරණයෙන් ක්‍රියාත්මක විය. මෙයට තරුණ මව්වරු 658 දෙනෙත් සහභාගී වූහ. මෙම අය අතර කලින් ආයුධ සන්නද්ධ කණ්ඩායම් සමග සිටි මව්වරු සහ වෙනත් අන්දමේ අවදානම් තත්වයන්ට ලක්වූ තරුණ මව්වරු ඇතුළත්ව සිටියහ. මේ අයට මනෝ සමාජීය සත්කාර සැලසීමේ සංධර්භයේදී, මෙම මව්වරු ඔවුන්ම කණ්ඩායම් වශයෙන් සංවිධානය වූ අතර තමන්ගේ ප්‍රශ්න නිර්ණය කරගැනීම සහ තමන්ගේ තත්වයන් පිළිබඳ විමසීමටත් ඒවා වෙනස්කර ගැනීම සඳහා සමාජ ක්‍රියාකාරකම් ගොඩනගා ගැනීමටත් ක්‍රියා කළහ. ව්‍යාපෘතියෙ ප්‍රතිඵල සමහරක් ලෙස: තරුණ මව්වරු සහ ඔවුන්ගේ ළමුන් සමාජීය වශයෙන් වඩාත් හොඳින් ඒකාබද්ධ වූ බව මෙම අය වඩාත් හොඳින් පවුලේ අය සහ සමාජය විසින් පිළිගැනීමෙන් සාක්ෂි සහිතව ඔප්පුවීම, වඩාත් ධනාත්මක කළමණාකරණ හැකියාවන් වර්ධනය කරගැනීම සහ ආර්ථික වශයෙන් දිවිරැක ගැනීම සඳහා ලිංගික ශ්‍රමිකයින් ලෙස කටයුතු කිරීම අවම වීම දක්විය හැකිය.

**මූලික යෙදුම්:** සහභාගිත්ව ක්‍රියාකාරී පර්යේෂණ (PAR), යුද්ධයේ බලපෑමට ලක්වූ තරුණ මව්වරු, ඵලදායී සහභාගිත්වය, නැවතඒකාබද්ධවීම, ලයිබීරියාව, උතුරු උගන්ඩාව, සියෙරා ලියොන්

## ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ක්‍රියාකාරීන් සඳහා මානසික සෞඛ්‍ය පිළිබඳ පුහුණුවක් ලබාදීම: ශ්‍රී ලංකාව, පාකිස්ථානය සහ ජෝර්දානයේ කරන ලද සිද්ධි අධ්‍යයනයක්

ජනතාවට වඩාත් පුලුල් ලෙස මානසික සෞඛ්‍යය සත්කාර සැලසීමේදී ඉතාමත්ම සාර්ථක ක්‍රමය නම් මානසික සෞඛ්‍යය වෘත්තිකයින් මගින් ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර අංශයට පුහුණුව ලබාදීම, සහය ලබාදීම සහ අධීක්ෂණය කිරීම බව සාක්ෂි මගින් පෙනීගොස් ඇත. විවිධ රටවල් වල ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සලසන්නන් සඳහා මානසික සෞඛ්‍ය පුහුණු වැඩසටහන් තුනක් ක්‍රියාත්මක කර ඒවායේ ප්‍රථිඵල පිළිබඳව පැහැදිලි කිරීමක් මෙම ලේඛනයේ අඩංගුය. මෙහි අරමුණ වන්නේ විවිධ ස්ථාන වල ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් ඇසුරින් ඉගෙනගත් පාඩම් තුලින් ලබාගත් දැනුම බෙදාහදා ගැනීමය. මෙම අධ්‍යයන ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සඳහා අදාළ අයුරින් ප්‍රාථමික හා ද්විතීයික දත්ත මෙහිදී උපයෝගී කරගෙන ඇත. මෙම මානසික සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන් තුලින් ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සලසන්නන්ගේ දැනුම පොදුවේ වැඩි කිරීමට හේතුවී ඇත. ඔවුන්ගේ මානසික සෞඛ්‍යය භාවිතයන් සම්බන්ධයෙන් වඩාත් තිරසාර වෙනස්කම් විවිධ සාදක වල සංකලනයක් තුලින් ලබාගෙන ඇති බව මෙහිදී හෙළිවිනි. ඒවා නම් a) වෘත්තීයමය වශයෙන් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද මානසික සෞඛ්‍ය පුහුණුව b) මෙයට සම්බන්ධවූ ප්‍රධාන ක්‍රියාකාරීන් සියලු දෙනාම ප්‍රජා මානසික සේවය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් දැක්වූ අභිප්‍රේරණය c) ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර අංශයට මානසික සෞඛ්‍යය ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරිමට සඳහා මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තිය සැකසීම මගින් රජය දේශපාලනික වශයෙන් මෙයට දැක්වූ කැමැත්ත d) වැඩසටහන සුදුසු කාලයේදී පැවැත්වීම සහ e) අරමුදල් සහ වෘත්තීයමය සහයෝගය ලැබීමයි. ප්‍රාථමික සෞඛ්‍යය සත්කාර සලසන්නන්ට මානසික සෞඛ්‍යය පුහුණුව ලබාදීම ප්‍රාථමික සෞඛ්‍යය සත්කාර අංශයට මානසික සෞඛ්‍යය ඒකාබද්ධ කිරීම සඳහා ගත හැකි එක් වැදගත් පියවරක් බවට ලෝක සෞඛ්‍යය සංවිධානය දරණ අදහසට මෙම ලේඛනය තුලින් අණාවරණය වූ කරුණු සහය දක්වයි.

**මූලික යෙදුම්:** මානසික සෞඛ්‍ය, ප්‍රාථමික සෞඛ්‍යය සත්කාර වැඩසටහන් සංවර්ධනය, මානසික සෞඛ්‍ය සත්කාර සේවා, කාර්යය මණ්ඩල සංවර්ධනය



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

**ආයුධ සන්නද්ධ සටන් කරුවන් ලෙස කටයුතු කළ නවයොවුන් තරුණියන් සහ කාන්තාවන් සාමාන්‍ය සිවිල් පුරවැසියන් බවට පත්කිරීම - ශ්‍රී ලංකාවේ සිද්ධි අධ්‍යයනයක්**

මෙම ලේඛනය මගින් ශ්‍රී ලංකාවේ මඩකලපුව ප්‍රදේශයේ, දෙමළ කොටි සංවිධානයට අනුයුක්තව සිටි කාන්තා සටන්කාමින් ගේ ජීවිත පිළිබඳව විස්තර කරනු ලබයි. මෙමගින් මාතෘ මූලික සමාජයක ඥාතිත්වය සහ කාන්තා ජාලයන්හි එකිනෙකා අතර පවතින බැඳීම්, එක්සත්භාවය, ගැටුම් සහිත වාතාවරණයකදි ඔවුන්ටගේ ජීවිත බේරාගැනීමට උපකාරී වූ අන්දම පැහැදිලි කරයි.මඩකළපුව ප්‍රදේශයේ කාන්තාවන් ගෘහමූලිකත්වය උසුලන පවුල් මීට පෙර සොල්දාදුවන් වශයෙන් කටයුතු කළ, කම්පනයට පත්වූ, සමහරවිට තුවාල වී නැවත තම පවුල් වෙත පැමිණෙන කාන්තාවන් රැකබලා ගැනීමේ දුෂ්කර අභියෝගයට මුහුණ දේ. මෙය සිදුවන්නේ ඒ සඳහා වූ සමාජ සුභසාධන සේවාවන් හෝ විශේෂ වෛද්‍ය හෝ මනෝසමාජයීය සත්කාර නොමැති පසුබිමකය. මෙම නිසා ආබාධිත වූ, සටන්කරුවන් ලෙස කටයුතු කළ කාන්තාවන්ට මෙම ප්‍රජාව තුල තම අනාගතය ගොඩ නගා ගැනීම ඉතා දුෂ්කර වී තිබේ. පෙර සටන්කරුවන් නැවත සමාජයට ඒකාබද්ධ කිරීමේ ශ්‍රී ලංකාවේ ජාතික වැඩසටහනට ආබාධිත පෙර සටන්කරුවන් ඇතුළත් වන නමුත් ඇත්ත වශයෙන් ක්‍රියාත්මක වීමේදී ආබාධිත කාන්තා පෙර සටන්කරුවන්ට මෙමගින් කිසියම් හෝ ආකාරයක සහයක් ලැබෙන්නේ ඉතා අවම වශයෙනි. මෙම ලේඛකයා පවසන්නේ දැනට සිදු කරගෙන යනු ලබන වැඩසටහන් වලින් ශ්‍රී ලංකා රජය සහ දෙමළ ජනතාව අතර විශ්වාසය ගොඩ නැගීම ඉලක්කක කරගනු නොලබන අතර එමගින් උත්සාහ කරන්නේ අදාළ ප්‍රදේශයේ ජනතාව සහ පෙර සටන් කරුවන් අතර ප්‍රතිසංධානයක් ඇති කිරීම බවය. මෙය අනවශ්‍ය කාර්යයකි. එසේ වන්නේ ප්‍රජාව විසින් ඔවුන් දැනටමත් පිළිගෙන ඔවුන්ට සහයෝගය දක්වන බැවිනි. මෙසේ නැවත පැමිණෙන කාන්තාවන්ට රැකවරණය සපයන පවුල් වලට වැඩිදෙනෙකුට ආහාර පාන සැපයීමට සිදුවන අතර එය ඔවුන්ට දුෂ්කර කාර්යයක් වන බැවින් අවම වශයෙන් ඔවුන්ට ආර්ථික වශයෙන් සහයෝගය ලබාදීමට කටයුතු කළ යුතුය.

**මූලික යෙදුම්:** තරුණ කාන්තාවන් සහ සොල්දාදුවන් වශයෙන් කටයුතු කරන තරුණ ගැහැණු ළමුන්, ළමා සොල්දාදුවන්, ආයුධහරණය, නිදහස් කිරීම සහ නැවත ඒකාබද්ධ කිරීම (DDR), ශ්‍රී ලංකාව

**මානසික සෞඛ්‍ය ක්‍රියාකාරීන්, ප්‍රජා සේවකයන්, මනෝ සමාජයීය ක්‍රියාකාරීන් සහ උපදේශකයින් සඳහා ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම - සහභාගීන් මූලික කොටගත් ප්‍රවේශයක්**

මෙම ලේඛනය මගින් තමන්ගේ රාජකාරිය සම්බන්ධයෙන් සීමිත අධ්‍යාපන දැනුමක් සහ ප්‍රායෝගික දැනුමක් ඇති, ආයුධ සන්නද්ධ ගැටුම් වලින් සහ/හෝ ස්වභාවික ආපදාවන්ගෙන් දැඩි ලෙස බලපෑමට ලක්වූ සේවාදායකයින් සමග කටයුතු කිරීමට සිදුවන 'භාෂණය මගින් සහය සැලසීම' රාජකාරිය කරගත් ක්‍රියාකාරකයින් සඳහා පැවැත්වුනු පුහුණුවක් පිළිබඳව විස්තර කරුණු ලබයි. මෙහි දී මෙම ක්‍රියාකාරකයින්ගේ ගති ලක්ෂණ, ඔවුන්ගේ ඉගෙනීම් අවශ්‍යතා, මෙම පුහුණුව මගින් ලබාදීමට අපේක්ෂා කළ පණිවිඩය, සහභාගිකයා විසින් ඔවුන්ට ගැලපෙන පරිදි විශේෂයෙන් සකස්කරන ලද වැඩසටහනක පවතින ගති ලක්ෂණ සඳහන් කර ඇත. මෙවැනි වැඩසටහනකින් ලබාගන්නා ලද අයිතමයන් කිහිපයක් උපයෝගී කරගෙන මෙම ප්‍රවේශය වැඩි දුරටත් පැහැදිලි කර ඇත.

**මූලික යෙදුම්:** ප්‍රජා සේවකයන් , උපදේශකයින්, භාෂණය මගින් සහය සැලසීම, මානසික සෞඛ්‍යය සේවකයන්, මනෝසමාජයීය සේවකයන් , පුහුණුව, පුහුණු කිරීම සඳහා මූලික කොටගත් ප්‍රවේශයක්

---

**ක්ෂේත්‍ර වාර්තාව: මානසික සෞඛ්‍ය වටපිටාවක ප්‍රායෝගික අත්දැකීමක් ඇසුරින් අධ්‍යයනය පිණිස අධ්‍යාපනික ක්‍රමවේදයක් ලෙස සමගාමීන් අතර ආධාරාත්මක අධීක්ෂණය.**

මෙම ක්ෂේත්‍ර වාර්තාව මිශ්‍ර කණ්ඩායමක සේවකයන්ගේ නිපුණත්වය දියුණු කිරීම අරමුණු කරගත් 'අඩු වියදම් ව්‍යාපෘතියක්' විස්තර කරයි. මෙම ව්‍යාපෘතියට ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ රෝහල් හතරක මානසික සෞඛ්‍ය ඒකකවලට සම්බන්ධ සහ අනුයුක්ත හෙද-හෙදියන්, ප්‍රජා සේවකයන්, උපදේශකයන් සහ මනෝ සමාජීය සේවකයන් ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය තුල නිපුණත්වය දියුණු කිරීම සඳහා මූලික උපදේශන පුහුණු වැඩසටහන්මාලාවක්ද, මාසිකව පැවැත්වෙන සමගාමීන් අතර අධීක්ෂණ සමුළුවලදී ක්‍රියාත්මක කෙරෙන මාර්ගෝපදේශනයන්ද ඇතුළත් කර තිබේ. සමගාමීන් අතර අධීක්ෂණය දැඩි ක්‍රියාපාටිපාටියකට අනුව සිදුකෙරෙන අතර, එය තම ප්‍රායෝගික අත්දැකීම්වලින් සහ සහෘද අත්දැකීම් තුළින් ඉදිරියට යන අධ්‍යාපනික අවස්ථාවක්ද වේ.

**මූලික යෙදුම්:** ප්‍රජා සේවකයන්, උපදේශනය, හෙද හෙදියන්, සමගාමීන් අතර අධීක්ෂණය, මනෝ සමාජීය සේවකයන්



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

## IASC මාර්ගෝපදේශන මාලාව සහ ජාත්‍යන්තර ව්‍යසනයන් පිළිබඳ ඩෙන්වර් විශ්ව විද්‍යාලයේ මනෝ විද්‍යා වැඩසටහන

ස්වාභාවිකව ඇතිවන සහ මිනිසා විසින් ඇතිකරන ව්‍යසනයන් මගින්  සැලකිය යුතු මානසික හා මනෝසමාජීය හානි පිළිබඳව ක්‍රමයෙන් ඉහලයන පිළිගැනීමක් ඇත. මෙම ප්‍රශ්න විසඳීමට ලොව වටා විසිර සිටින විවිධාකාර ජනසමාජයන් තුල කුසලතාවලින් හෙබි වෘත්තිකයන් සඳහාවන ඉල්ලුම වැඩි කිරීමට මෙම සංසිද්ධිය හේතුවී ඇත. ජාත්‍යන්තර ව්‍යසන පිළිබඳ මනෝවිද්‍යා ශාස්ත්‍රපති වැඩසටහන ගොඩනගා ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදය තුලත් ලොව වටාත් ව්‍යසන මනෝවිද්‍යා ක්ෂේත්‍රයයේ කර්තව්‍යයන් ඉටු කිරීමට අවශ්‍ය වෘත්තිකයන්ගේ අධික ඉල්ලුම සපුරාලීමටය. මෙම වැඩසටහන අන්තර් නියෝජන කමිටුවේ (IASC) මානසික සෞඛ්‍යයේ සහ හදිසි තත්ත්වයන් ඇති වටපිටාවන්හි මනෝසමාජීය ආධාර දීම පිළිබඳ  මාර්ගෝපදේශන මාලාව පුළුල්ව ප්‍රයෝජනයට ගෙන තිබේ. මෙම විචාරාත්මක ඇගයීම පශ්චාත් ව්‍යසන වටපිටාවන්හි සේවයේ යෙදෙන ආචාර්යරුන්, සිසුන් සහ වෘත්තිකයන්ට ප්‍රායෝගික තොරතුරු සැපයීම අරමුණු කරගෙන තිබේ.

**මූලික යෙදුම්:** ජාත්‍යන්තර ව්‍යසන මනෝවිද්‍යාව, මානසික සෞඛ්‍ය, හදිසි තත්ත්වයන්, මනෝසමාජීය යහපැවැත්ම, IASC මාර්ගෝපදේශනාලාව

## ගණිතයේ සිට මනෝසමාජීය කර්තව්‍යයන් කරා දශකයක් පුරා කොසෝවෝ හි දරුවන් හට සිදුකරන ලද මනෝසමාජීය මෙහෙවර පිළිබඳ පුද්ගලික ආවර්ජනාවන්

ප්‍රථමයෙන් ගණිත මහාචාර්යවරයකු වූ මෙම ක්ෂේත්‍ර වාර්තා කතෘ විසින් තම වෘත්තිමය වෙනසට කොසෝවෝහි පීඩනය හා සාහසික ඝට්ටනයන් බලපෑ ආකාරයත්, දරුවන් සඳහා මනෝසමාජීය ආධාර ලබාදෙන දේශීය රාජ්‍ය නොවන ආයතනයක ප්‍රාරම්භකයා වීමටද ඉවහල් වූ අයුරුත් විස්තර කර ඇත.
ගැටුමෙන් පසු මනෝසමාජීය කටයුතු බොහොමයක් සංවිධානය කෙරිනි. නමුත් මෙහිදී අවාසනාවන්ත ලෙස දේශීය අත්දැකීම් නොසලකා හරින ලදී. දශකයකට අධික තම අත්දැකීම් තුළින් මෙම කතුවරයා අවධාරණය කරන්නේ ගුරු භූමිකාව දරුවන් උදෙසා මනෝ-සමාජීය ආධාර වැඩිදියුණු කිරීම උදෙසා ප්‍රධාන නියෝජනයක් ලෙස සැලකිය හැකි බවය. තවද අන්තර්ජාතික ආයතන ජාත්‍යන්තර කාර්ය මණ්ඩල මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වලට වඩා දේශීය ධාරිතාවයන් හා හැකියාවන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයද කතුවරයා විසින් අවධාරණය කර ඇත.

**මූලික යෙදුම්:** ගුරුවරුන්, දරුවන්, ධාරිතාවන් හා හැකියා වර්ධනය, පාසැල් පාදක මැදිහත්වීම්, ප්‍රතිසංධනය, කොසෝවෝ



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.